මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
මතුගම අධ්‍යාපන කලාපය

# දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| ගිණුම්කරණය I | 12 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

උපදෙස් :- ♦ 1 - 30 දක්වා නිවැරදි වරණය තිත්ඉරි මත ලියන්න.
♦ 31 - 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් ප්‍රකාශ අතුරින් ගිණුම්කරණය පිළිබඳ වඩාත් හොඳින් විස්තර කරන ප්‍රකාශය වන්නේ,
i. ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු වාර්තා කිරීම.
ii. ව්‍යාපාරයක බාහිර පාර්ශ්වයන්ට තීරණ ගැනීමට තොරතුරු සැපයීම.
iii. ව්‍යාපාරය සිදුවන ගනුදෙනු පිළිබඳ විධිමත් වාර්තා පවත්වාගෙන යාම.
iv. ව්‍යාපාරයක ඇල්මක් දක්වන පාර්ශවයන්ට ගිණුම්කරණ ඒකකයට අදාලව තීරණ ගැනීම සඳහා ආර්ථික තොරතුරු සැපයීම් ක්‍රියාවලිය.
v. ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු දැන ගැනීම හා මූල්‍ය තත්ත්වය හඳුනා ගැනීම.
(............)

02. ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,
i. ආයතනයේ සියලුම ගනුදෙනු ගිණුම්පොත් වල සටහන් කිරීමයි.
ii. ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති තොරතුරු විශ්ලේෂණය කිරීමයි.
iii. ආයතනයක් පිළිබඳ තොරතුරු ඒවා භාවිතා කරන පාර්ෂවයන්ට තීරණ ගැනීම සඳහා සැපයීම.
iv. ආයතනයක ගනුදෙනු සටහන් කිරීම, වර්ගකිරීම හා සාරාංශ කිරීම.
v. ආයතනයේ වංචා හා දූෂණ වැළැක්වීමයි.
(............)

03. ව්‍යාපාර ආයතනයක් සම්බන්ධව පහත තොරතුරු අතුරින් කුමන තොරතුරට වෙළඳ ණයහිමියන් ඇල්මක් දක්වන්නේ ද?
i. වාර්ෂික ලාභාංශ
ii. වාර්ෂික ලාභය
iii. නියමිත කාලයේ දී ණය ගෙවීමේ හැකියාව
iv. ව්‍යාපාරය ප්‍රති සංවිධානය කිරීමේ හැකියාව
v. ව්‍යාපාරයේ කීර්ති නාමය
(............)

04. 2019. 03. 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන්
මුළු වත්කම් රු. 400, 000
බාහිර වගකීම් රු. 150, 000

2019. 03. 31 දිනට අවසන් වර්ෂයට පහත සඳහන් ගනුදෙනු සිදු විය.
1. කාලච්ඡේදයේ ජංගම නොවන වත්කම් ක්ෂය රු. 10, 000
2. බැංකු ණය රු. 25, 000/- ගෙන අයිරාව පියවා ඇත.
3. ගෙවිය යුතු සේවක වැටුප රු. 10, 000
4. රු. 10, 000 ක අත්තිකාරම් මුදලක් ලැබී ඇත.

2019. 03. 31 දිනට ගිණුම්කරණය සමීකරණය

| | වත්කම් | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|---|
| i. | 400, 000 | = | 170, 000 | + | 230, 000 |
| ii. | 410, 000 | = | 180, 000 | + | 230, 000 |
| iii. | 390, 000 | = | 160, 000 | + | 230, 000 |
| iv. | 400, 000 | = | 150, 000 | + | 250, 000 |
| v. | 400, 000 | = | 250, 000 | + | 150, 000 |

(............)

05. පහත සඳහන් ගනුදෙනු අතුරින් වගකීම් වැඩි වී, වගකීම් අඩු වීමට හේතුවක් වනුයේ,

i. බැංකු ණයක් ලබා ගැනීම.

ii. බැංකු අයිරාවක් පවතින විට උපචිත විදුලි වියදම් සඳහා රු. 7 500 ක චෙක්පතක් නිකුත් කිරීම.

iii. විදුලිය සඳහා මුදලින් රු. 5 000 ගෙවීම

iv. ණයගැතියන්ට රු. 500 ක වට්ටම් ලැබීම.

v. ණයහිමියන්ගෙන් රු. 500 ක වට්ටමක් ලැබීම්

(............)

06. සිකුරුගේ ව්‍යාපාරයේ 2018. 04. 01 දින සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

අත්පිට ගැනුම් රු. 40, 000

ණයට ගැනුම් රු. 60, 000

ඉහත දැක්වෙන ගනුදෙනුවල බලපෑම නිවැරදිව පෙන්නුම් කරන පිළිතුර තෝරන්න.

i. වත්කම් වැඩිවීම රු. 60 000 - වගකීම් අඩු වීම රු. 60 000

ii. වත්කම් වැඩිවීම රු. 60 000 - වගකීම් වැඩිවීම රු. 60 000

iii. වත්කම් වැඩිවීම රු. 100 000 - වගකීම් වැඩිවීම රු. 100 000

iv. වත්කම් අඩුවීම රු. 100 000 - වගකීම් වැඩිවීම රු. 100, 000

v. හිමිකම් වැඩිවීම රු. 100 000 - වත්කම් වැඩිවීම රු. 100 000 (............)

07. මිහිරි 2018. 04. 01 දින රු. 200, 000 කී මුදලින් යොදවා ව්‍යාපාරයක් ආරම්භ කලාය. 2018 අප්‍රේල් මස රු. 160, 000 ක වියදමක් ඇති වූ අතර, ඉන් රු. 40, 000 ක් මිහිරිගේ පෞද්ගලික බැංකු ගිණුමෙන් ගෙවන ලදී. මාසය තුල දී රු. 240, 000 ක ආදායමක් වූයේ නම් 2018 අප්‍රේල් 30 ව්‍යාපාරයේ ශුද්ධ වත්කම කීය ද?

i. රු. 320, 000 ii. රු. 310, 000

iii. රු. 305, 000 iv. රු.360, 000

v. රු. 340, 000

(............)

08. ගිණුම් සමීකරණයේ බලපෑම ශුන්‍ය වන ගනුදෙනුව වන්නේ,

i. අයිතිකරු විසින් භාණ්ඩ ගැනිලි සිදු කිරීම.

ii. අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනය යෙදවීම.

iii. අයිතිකරු විසින් තමා සතු ගොඩනැගිල්ල ව්‍යාපාරයට යෙදවීම.

iv. බඩු තොගයක් ණයට ගැනීම.

v. බඩු තොගයක් අත්පිට විකිණීම.

(............)

09. ව්‍යාපාරයක බැංකු අයිරාව එහි අයිතිකරුගේ පෞද්ගලික අරමුදල් වලින් පියවා ඇත. මෙය ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ,

i. වත්කම් හා ස්කන්ධය යක දෙකම වැඩිවීම.

ii. වගකීම් වැඩිවීම හා ස්කන්ධය අඩුවීම.

iii. වගකීම් අඩුවීම හා ස්කන්ධය වැඩිවීම.

iv. වත්කම් හා වගකීම් දෙකම අඩුවීම.

v. වගකීම් අඩුවීම හා වත්කම් වැඩිවීම.

(............)

10. උපචිත විදුලි ගිණුම,

i. වත්කම් ගිණුමකි. ii. වියදම් ගිණුමකි.

iii. ආදායම් ගිණුමකි. iv. වගකීම් ගිණුමකි.

v. හිමිකම් ගිණුමකි. (............)

11. පහත ගිණුම්කරණ සමීකරණ අතුරින් කුමන සමීකරණ නිවැරදි වන්නේ ද.

A - ශුද්ධ වත්කම් = හිමිකම්

B - වත්කම් + ආදායම් = හිමිකම් + වගකීම් + වියදම්

C - වත්කම් + වියදම් = හිමිකම් + වගකීම් + ආදායම්

D - ලාභය = මුළු වත්කම් - වගකීම්

i. B හා C පමණි ii. B, C හා D පමණි iii. A, B, C පමණි
iv. A, C පමණි v. A පමණි

(............)

12. ව්‍යාපාරයක් සතු වත්කම්, වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගකිරීමේ පදනම් වන ගිණුම්කරණ
ව්‍යාපාරයක් සතු වත්කම්, වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගකිරීමේ පදනම් වන ගිණුම්කරණ
සමීකරණ සංකල්පය වන්නේ,

i. අඛණ්ඩ පැවැත්ම ii. ගැලපුම් iii. උපචිත
iv. කාලච්ඡේද v. සංගතතා

(............ )

13. මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී පදනම කරගත යුතු මූලික උපකල්පනය වනුයේ,

i. උපචිත පදනම ii. මුදල් පදනම iii. අඛණ්ඩ පැවැත්ම
iv. විෂයානුකූල බව v. ව්‍යාපාර ඒකක සංකල්පය (............)

14. ව්‍යාපාරයක් විසින් 2018. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රක්ෂණය සඳහා ගෙවූ රු. 150 000 ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කර ඇත්තේ රු. 100 000 ලෙස මෙයට පදනම සපයන ගිණුම්කරණ සංකල්පය වනුයේ

i. උපචිත ii. ඒකක iii. සංගතතාව iv. උපලබ්ධි v. ආරක්ෂණ

(............)

15. ද්විත්ව සටහන් ක්‍රමය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

I. ද්විත්ව සටහන් ක්‍රමය ගිණුම්කරණ සමීකරණය සඳහා පදනම සපයයි.
ii. එය ගනුදෙනු ලෙජරයට පිටපත් කරන ක්‍රමයකි.
iii. සියළුම ගනුදෙනු ලෙජරයේ නිවැරදිව වාර්ථා වී ඇති බව තහවුරු කරයි.
iv. මූලික රීතිය වනුයේ සෑම හර සටහනකටම ඊට අනුරූප බැර සටහනක් තිබීමයි.
v. ගනුදෙනුවක ද්විත්ව ප්‍රතිඵල හර හා බැර වශයෙන් එකවර සටහන් කරයි.

(............)

16. අමල් විසින් සමන්ගෙන් භාණ්ඩ තොගයක් මිලටගෙන සති 2 ඇතුලත චෙක්පතක් නිකත් කර ගෙවීම් කරන ලදී. ඇතැම් අයිතම පලුදු වීම නිසා සමන් වෙත ආපසු යවන ලදි. මෙම ගනුදෙනු අමල්ගේ මූලික පොත් වල වාර්ථා කිරීමට අදාල ප්‍රථම ලියවිලි වන්නේ,

i. ඉන්වොයිසිය, චෙක්පිලිපත, බැරපත
ii. ඉන්වොයිසිය, චෙක්පිලිපත, හරපත
iii. ඉන්වොයිසිය, ගෙවීම් වව්චරය, බැරපත
iv. ඉන්වොයිසිය, ගෙවීම් වව්චරය, හරපත
v. වවුචරය , පිලිපත, බැරපත

(............)

17 ආපසු එවුම් වාර්තා කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත වන්නේ,

I. හරපත, ආපසු එවුම් ජ'නලය ii. බැරපත, ආපසු එවුම් ජ'නලය
iii. හරපත, විකුණුම් ජ'නලය iv. ජ'නල වව්චරය, ආ. එවුම් ජ'නලය
v. බැරපත, ගැනුම් ජ' නලය

(............)

18. X තීරුවේ මූලික පොත් ද, Y තීරුවේ මූලාශ්‍ර ලේඛන ද දක්වා ඇත.

| | X | | | Y |
|---|---|---|---|---|
| 1. | මුදල් පොත | A | - | ඉන්වොයිසිය |
| 2. | ගැනුම් ජ'නලය | B | - | ජ'නල් වවුචරය |
| 3. | පොදු ජ'නලය | C | - | හරපත |
| 4. | ආපසු එවුම් ජ'නලය | D | - | වවුචරය |
| 5. | ආපසු යැවුම් ජ'නලය | E | - | බැරපත |

X තීරුවේ සඳහන් මූලික පොත් සඳහා භාවිතා කරන මූලාශ්‍ර ලේඛනය Y තීරුවේ ගැලපූ විට පිළිතුර වන්නේ,

i. D, A, B, E හා C
ii. A, D, B, E හා C
iii. D, A, B, C හා E
iv. B, A, D, E හා C
v. C, A, B, E හා D (............)

19. සී/ස සුදසුන සමාගම විසින් ගනුදෙනුකරුවකු වන නයනා වෙත භාණ්ඩ ණයට විකුණා ඇත. දින 30ට පසුව නයනා මුදල් ගෙවා දැමුවද දෝෂ සහිත නිසා භාණ්ඩ ආපසු ගෙනවිත් භාර දෙන ලදි.
මෙම ගනුදෙනු සුදසුන සමාගමේ පොත්වල සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලියවිලි වන්නේ,

i. ඉනාවොයිසිය, වවුචරය, හරපත
ii. ඉන්වොයිසි, ලදුපත, බැරපත
iii. ඉන්වොයිසිය, ලදුපත, හරපත
iv. ඉන්වොයිසිය, ලදුපත, භාණ්ඩ ලැබීම්පත
v. ලදුපත, හරපත, ඉන්වොයිසි (............)

20. සීමිත තුලන සමාගමේ ගැනුම් ඉන්වොයිසියකින් උපුටා ගත් කොටසක් පහත දැක්වේ.

| දිනය | සැපයුම්කරු | වටිනාකම (රු. 000) |
|---|---|---|
| 2018. 04. 05 | සීමිත පබෝදා සමාගම | 400 |
| | වට්ටම 10% | (40) |
| | | 360 |

කොන්දේසි - මාසයක් ඇතුලත මුදල් පියවන්නේ නම් 10% ක වට්ටමක් හිමි වේ.

සීමිත තුලන සමාගම ඉහත ගනුදෙනුවට අදාල මුදල 2018. 04. 20 දින පියවන ලදි. වට්ටම් ගිණුම්ගත කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

| | හර | බැර | |
|---|---|---|---|
| i. | දුන් වට්ටම් ගිණුම 36 000 | ණයගැති පාලන ගිණුම | රු. 36 000 |
| ii. | ණයහිමි පාලන ගිණුම 36 000 | ලද වට්ටම් ගිණුම | රු. 36 000 |
| iii. | ණයහිමි පාලන ගිණුම 40 000 | ලද වට්ටම් ගිණුම | රු. 40 000 |
| iv. | දුන් වට්ටම් ගිණුම 40, 000 | ණය ගැති පාලන ගිණුම | රු. 40 000 |
| v. | ණයහිමි පාලන ගිණුම 76 000 | ලද වට්ටම් ගිණුම | රු. 76 000 |

(............)

21. සීමිත ජනක් තොග වෙලද සමාගමින් රෝයි භාණ්ඩ මිලට ගනී. ඔහුට මිල ලේඛනයේ සඳහන් මිලෙන් 25% ක වෙලද වට්ටමක් ද, මාසය තුල ගෙවීම් කලහොත් අමතරව 5% ක මුදල් වට්ටමක් ද ජනක් තොග වෙලද සමාගම දෙනු ලබයි. 2018 මාර්තු මාසයේ මිල ලේඛනයේ රු. 800 000 ක් සඳහන් භාණ්ඩ රෝයි මිලට ගෙන මසක් ඇතුලත මුදල් පියවන ලදී. රෝයිගේ ගැනුම් ජනලයේ ගැණුම් ලෙස සටහන් වන්නේ,

i. රු. 800, 000
ii. රු. 570, 000
iii. රු. 640, 000
iv. රු. 600, 000
v. රු. 560, 000 (............)

අංක 22 සිට 23 සඳහා පහත තොරතුරු ඇසුරින් පිලිතුරු සපයන්න.

2018. 03. 01 දිනට සුළු මුදල් ශේෂය රු. 450
2018. 03. 01 දිනට සුළු මුදල් ප්‍රතිපූරණය සඳහා ලද මුදල රු. 2550

| | ගමන් | ලිපිද්‍රව්‍ය | තැපැල් | විවිධ |
|---|---|---|---|---|
| මාර්තු 2018 | 420 | 560 | 250 | 1 300 |
| අප්‍රේල් 2018 | 580 | 700 | 190 | 1 375 |

ව්‍යාපාරය වියදම් ප්‍රතිපූරණය කරනුයේ ඊලඟ මාසයේ පලමු දිනයේය.

22. සුළු මුදල් පොතේ 2018. 03. 31 දිනට ශේෂය
i. රු. 625 ii. රු. 470 iii. රු. 155 iv. රු. 420 v. රු. 6200
(............)

23. 2018. 05. 01 දින ප්‍රතිපූරණය කල යුතු මුදල වනුයේ,
i. රු. 2530 ii. රු. 2845 iii. රු. 5375 iv. රු. 2580 v. රු. 2895
(............)

24. පහත සඳහන් වැරදිවලින් ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වැරදි වනුයේ,
i. රු. 25 000 වූ විකුණුම් ඉන්වොයිසියක් රු. 52 000 ක් ලෙස විකුණුම් ජනලයේ සටහන් කර ඇත.
ii. රු. 10 000 ක් වූ ආපසු එවුම, ආපසු යැවුම් ගිණුමේ බැරට සටහන් කර ඇත.
iii. රු. 12 000 අත්පිට විකුණුම් පොත්වලින් මඟ හැරී ඇත.
iv. රු. 6000 ක ලද වට්ටම්, දුන් වට්ටම් ගිණුමට බැර කර ඇත.
v. රු. 30 000 ක යන්ත්‍ර අලුත්වැඩියා වියදම යන්ත්‍ර ගිණුමේ හරට සටහන් කර ඇත.
(............)

25. වර්ෂයක දී තනි ව්‍යාපාරිකයකුගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය 100, 000 වැඩි විය.
පහත කුමන ගනුදෙනුව මෙම වැඩිවීම පෙන්නුම් නොකරේ ද?
i. රු. 100 000 ලාභයක් ව්‍යාපාරය ඉපයීම.
ii. අයිතිකරු රු. 100 000 අමතර ප්‍රාග්ධනයක් යෙදවීම.
iii. ව්‍යාපාරයේ භාවිතය සඳහා ඔහුගේ රු. 100 000 වටිනා යන්ත්‍රයක් ගෙන ඒම.
iv. අයිතිකරු ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ඔහුගේ පෞද්. ණයක් වන රු. 100 000 ගෙවීම.
v. අයිතිකරු ව්‍යාපාරයේ වාර්ෂික කඩකුලී ඔහුගේ මුදලින් දැරීම. (............)

26. පහත දැක්වෙන කුමන ගනුදෙනුව ආයතනයක ගැනුම් ජ'නලයේ සටහන් කරයි ද?
i. ණයට මිල දී ගන්නා සියලු වත්කම්
ii. විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියලු ගැනුම්
iii. විකිණීමේ පරමාර්ථයෙන් කරනු ලබන සියළුම ණයට ගැනුම්
iv. ණයට විකිණීමේ පරමාර්ථයෙන් කරනු ලබන සියලුම ගැනුම්
v. අත්පිට ගැණුම් (............)

27. පහත සඳහන් ගනුදෙනු සටහන් කිරීමේ දී පොදු ජ'නලය භාවිතා නොකරන්නේ,
i. ණයට භාණ්ඩ විකිණීමේ දී ii. දෝෂ නිවැරදි කිරීමේ දී
iii. ජංගම නොවන වත්කම් ණයට මිලට ගැනීමේ දී iv. ක්ෂය ප්‍රතිපාදනයේ දී
v. අඩමාණ ණය ප්‍රතිපාදනයේ දි (............)

28. කඩකුලී වියදම් රු. 15 000 කඩකුලී ආදායම් ගිණුමේ සටහන් වී ඇත. මෙම වරද නිවැරදි කිරීමේ ජ'නල් සටහන් වන්නේ,

i. කඩකුලි වියදම් හර 15 000
කඩකුලි අදායම් බැර 15 000

ii. කඩකුලි වියදම් හර 15 000
අවිනිශ්චිත ගිණුම බැර 15 000

iii. කඩකුලී වියදම් හර 15 000
කඩකුලි ආදායම් හහර 15 000
අවිනිශ්චිත ගිණුම 30 000

iv. කඩකුලි ආදායම් හර 15 000
අවිනිෂ්චිත ගිණුම 15 000

v. අවිනිශ්චිත හර 30 000
කඩකුලී ආදායම් 15 000
කඩකුලී වියදම් 15 000

(............)

29. විකුණුම් පිරිවැය ගණනය කිරිමේ දී ව්‍යාපාරයක අවසාන තොගයේ අගය දැක්විය යුත්තේ,

I. ශුද්ධ උපලබ්ධි අගයට
ii. පිරිවැයට
iii. විකුණුම් මිලට
iv. ශුද්ධ විකුණුම් මිලට
v. පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට

(............)

30. පහත කුමන මූල්‍ය ප්‍රකාශනය නිශ්චිත දිනකට පිලියෙල කරන්නේ ද?

A - මූල්‍ය තත්ව ප්‍රකාශය
B - ආදායම් ප්‍රකාශය
C - හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය
D - මුදල් ප්‍රවාහ ප්‍රකාශය

i. A පමණි. ii. C පමණි. iii. A හා C පමණි.
iv. A, B, D පමණි. v. A, B, C,D සියල්ල

(............)

ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

31. මූල්‍ය ප්‍රකාශන තුල පහත අයිතම හඳුනාගනු ලබන්නේ කුමන මූලිකාංග ලෙසද?
(වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම්)

i. කපාහල බොල් ණය ...................................
ii. ලැබිය යුතු ගෙවල් කුලී ආදායම..............................
iii. අතිරේක ප්‍රාග්ධනය යෙදවීම්.......................
iv. කලින් ලද කොමිස් ආදායම....................................

32. පහත ගනුදෙනු සඳහා වඩාත් හොඳින් අදාළ වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?

A - ඒකක සංකල්පය
B - ගැලපුම් සංකල්පය
C - ඓතිහාසික පිරිවැය සංකල්පය
D - උපචිත සංකල්පය

ගිණුම්කරණ සංකල්පය

i. සේවක අර්ථසාධක ගාස්තුව ලෙස රු. 20 000 ක් ගෙවීම. ......................................................

ii. දේපල, පිරියත හා උපකරණ අත්පත් කරගත් පිරිවැය වූ රු. 50 000 ට මිල කිරීම. ......................................................

iii. අයිතිකරු කරන ලද රු. 60 000 ක ගැනිලි ප්‍රාග්ධනයෙන් අඩු කිරීම.

......................................................

iv. රු. 50 000 ක ණය හිමියෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනා ගැනීම.

......................................................

33. පහත ප්‍රකාශ සත්‍ය/අසත්‍ය වේද යන්න දක්වන්න.

සත්‍ය/ අසත්‍ය

i. ණයහිමියන්ට මුදල් ගෙවූ විට හිමිකම අඩු වේ. ......................................................

ii. ණයගැති ශේෂයන් ණයහිමි ශේෂයකට හිලව් කරන විට වත්කම් හා වගකීම් අඩු වේ. ......................................................

iii. ණයක් සඳහා පොළී ගෙවූ විට වගකීම් අඩු වේ. ......................................................

iv. දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීමේ දී වත්කම අඩු වේ. ......................................................

34. ව්‍යාපාරයක් විසින් වැරදි නිවැරදි කිරීම සඳහා තබන ලද ජ'නල් සටහන් පහත පරිදි වේ.

A - දුන් වට්ටම් ගිණුම හර 1 200
වට්ටම් ගිණුම හර 1 200
අවිනිශ්චිත ගිණුම බැර 2 400

B - විදුලි ගාස්තු ගිණුම හර 800
අවිනිශ්චිත ගිණුම බැර 800

ඉහත දක්වා ඇති එක් එක් ගිණුම්කරණ දෝෂ වටිනාකම් සහිතව විස්තර කරන්න.

A ..................................................................................................................................
..................................................................................................................................

B ..................................................................................................................................
..................................................................................................................................

35. පහත සඳහන් ගනුදෙනු වල බලපෑම ධන ''+'' හෝ ඍණ ''-'' ලකුණු යොදා වටිනාකම් සහිතව දක්වන්න.

| විස්තරය | වත්කම | වගකීම් | හිමිකම |
|---|---|---|---|
| i. රු. 75 000 ක පිරිවැය වූ තොගයක් රු. 100 000 ට විකිණීම. | | | |
| ii. රු. 5 000 ක පිරිවැය වූ තොගයක් අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම. | | | |

36. පහත කාර්යයන් මූල්‍ය ගිණුම්කරණයට අයත් වේ ද? නැද්ද? යන්න සඳහන් කරන්න.

| | අයත් වේ | අයත් නොවේ |
|---|---|---|
| I. ඇල්මැති පාර්ශවයන්ට තොරතුරු සැපයීම | | |
| ii. ඓතිහාසික හා පුරෝකථන තොරතුරු යොදා ගැනීම. | | |
| iii. කළමනාකරණයට අවශ්‍ය වන අවස්ථාවන්හි තොරතුරු ඉදිරිපත් කිරීම. | | |
| iv. ගිණුම්කරණ සංකල්ප, සම්ප්‍රදායන් යොදා ගැනීම. | | |

37. ව්‍යාපාරයක 2019. 03. 31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 6 800 කි. එදිනට ශේෂ ලැයිස්තුවේ අගය රු. 7 800 කි. මෙම තත්ත්වය ඇති වීමට බලපාන හේතු 02 ක් සඳහන් කරන්න.

i. ..............................................................................................................................

ii. ..............................................................................................................................

38. චාමරගේ ව්‍යාපාරයේ රු. 5 000 ක් වටිනා තොග ගින්නෙන් හානි වූ අතර එයින් 80% සඳහා රක්ෂණ වන්දි මුදලක් ලැබීමට නියමිතය. මීට අදාල ද්විත්ව සටහන වනුයේ,

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

39. කේවල ස්වාමි / තනි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවලින් සපයන තොරතුරු භාවිතා කරන,

i. අභ්‍යන්තර පාර්ශව 2 ක් - .........................................., ..........................................

ii. බාහිර පාර්ශව 2 ක් - .........................................., ..........................................

පහත තොරතුරු ප්‍රශ්න අංක 40 ට හා 41 ට අදාළ වේ. ව්‍යාපාරයක 2019. 03. 31 දිනට පැවති ජංගම නොවන ද වත්කම් පිළිබඳ තොරතුරු

| වත්කම | මිලට ගත් දිනය | පිරිවැය/ගත්මිල | 2019. 03. 31 දිනට සමුච්චිත ක්‍ෂය | ඵලදායී ජීවකාලය |
|---|---|---|---|---|
| මෝටර් රථය | 2018. 04. 01 | 60 000 | 5 000 | 10 |
| කාර්යාල උපකරණ | 2018. 04. 01 | 15 000 | 1 500 | 10 |

2019. 03. 31 දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා

40. i. මෝටර් රථවල වාර්ෂික ක්‍ෂය - ....................................................

ii. කාර්යාල උපකරණවල වාර්ෂික ක්‍ෂය - ....................................................

41. 2018. 04. 01 දිනට,

i. මෝටර් රථවල ක්‍ෂය කල හැකි අගය - ....................................................

ii. කාර්යාල උපකරණ වල ක්‍ෂය කල හැකි අගය - ....................................................

42. ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ. එම ගනුදෙනුවලින් වෙළඳ ණයහිමියන්ට ඇතිවන බලපෑම වැඩිවේ/ අඩුවේ/ වෙනස් නොවේ යන්න සඳහන් කරන්න.

i. කාර්යාල උපකරණ ණයට ගැනීම

ii. වෙළඳ වට්ටම් ලැබීම

iii. වෙළඳ තොග ආපසු යැවීම.

iv. රක්ෂණ ගාස්තු සඳහා නිකුත් කල චෙක්පත අගරු වීම.

අංක 43 හා 44 ප්‍රශ්නවලට පහත තොරතුරු අදාල වේ.
ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගත් තොරතුරු පහත පරිදි වේ.

2019. 03. 31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 62 500
2019. 03. 31 දිනට ගබඩාවේ පැවති තොගය රු. 8 000

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත ගැලපුම් සටහන් මඟහැරී ඇත.

1. විකුණුම් මිල රු. 6 000 ක තොග 2019. 03. 25 දින විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ගනුදෙනු කරුවෙකු වෙත යවා ඇත. එය ණයට විකුණුම් ලෙස සටහන් කර ඇතත් 2019. 03. 31 දිනටත් මෙම තොගය විකුණා නැත. මෙම තොගයේ පිරිවැය රු. 4 500 කි.

2. පොත්වල වාර්තා නොවූ ආපසු යැවුම් රු. 200 කි.

43. නිවැරදි ශුද්ධ ලාභය 2019. 03. 31 ට ..................................................

44. ගැලපිලි සටහන් වාර්තා කිරීමෙන් පසු 2019. 03. 31 දිනට,

i. වත්කම් වල වැඩිවීම/ අඩුවීම ..................................................

ii. වගකීම් වල වැඩිවීම/ අඩුවීම ..................................................

ප්‍රශ්න අංක 45, 46 ට පහත තොරතුරු අදාල වේ.
VAT ලියාපදිංචි සමාගමක 2019 ජනවාරි මස ණයට ගැනුම් ණයට විකුණුම් තොරතුරු

| | විකුණුම් මිල | ගැනුම් මිල | VAT බදු | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| විකුණුම් | 5 000 | - | 750 | 5750 |
| ගැනුම් | - | 3 000 | 450 | 3450 |

වෙනත් තොරතුරු
VAT බදු මුදලින් ගෙවීම් රු. 100

45. ණයට විකුණුම් වාර්තා කිරීමේ ද්විත්ව සටහන ( VATසහිත)
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................

46. VAT බදු පාලන ගිණුමේ ශේෂය 2019. 01. 31 ට
..................................................................................................................................................
..................................................................................................................................................

47. පහත ගනුදෙනු වලට අදාල මුලික සටහන් පොත හා මුලාශ්‍ර ලේඛන වනුයේ,

| | | මුලික සටහන් පොත | මුලාශ්‍ර ලේඛනය |
|---|---|---|---|
| i. | රු. 5 000 ක වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් | ................................ | ................................ |
| ii. | රු. 2 00 ක සංග්‍රහ වියදම් ගෙවීම් | ................................ | ................................ |
| iii. | රු. 7 000 ක ණය ගැති ලැබීම් | ................................ | ................................ |
| iv. | රු. 1 000 ක බොල් ණය කපා හැරීම් | ................................ | ................................ |

48. බැංකු සැසඳුමක් යනු කුමක් ද?

................................................................................................................................................................

................................................................................................................................................................

49. ව්‍යාපාරයක සිදු වු පහත දැක්වෙන එක් එක් ගනුදෙනු ව වාර්තා කිරීමට අදාල ගිණුම් වර්ග දෙක ✔ මඟින් නිරුපණය කරන්න.

| | ගනුදෙනුව | වත්කම් | වගකීම් | හිමිකම් | ආදායම් | වියදම් |
|---|---|---|---|---|---|---|
| i. | අත්පිට ගැනුම් | .................... | .................... | .................... | .................... | .................... |
| ii. | ආපසු යැවුම් | .................... | .................... | .................... | .................... | .................... |
| iii. | බොල්ණය කපා හැරීම | .................... | .................... | .................... | .................... | .................... |
| iv. | වැටුප් ගෙවීම් | .................... | .................... | .................... | .................... | .................... |

50. මුදල් ගෙවීම් ජ'නලයේ වෙනත් ලැබීම් තීරුවේ සටහන් කරන වෙනත් ලැබීම් 2 ක් වනුයේ,

i. ....................................................................................................................................................

ii. ....................................................................................................................................................

මුදල් ගෙවීම් ජ'නලයේ වෙනත් ගෙවීම් තීරුවේ සටහන් කරන වෙනත් ගෙවීම් 2 ක් වනුයේ,

i. ....................................................................................................................................................

ii. ....................................................................................................................................................

(2 x 50 = 100)

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

ගිණුම්කරණය II | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි

උපදෙස් :- ♦ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
♦ අදාල පෙරවැඩ පිළිතුරු පත්‍රයට අමුණන්න.

01. ලොතරැයි දිනුමකින් ලද රු. මිලියන 6 ක් ආයෝජනය කරමින් 2018. 04. 01 දින දිමුතු වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එදිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | | (රු. 000) |
|---|---|---|
| | හර | බැර |
| ප්‍රාග්ධනය | | 6 000 |
| බෙදාහැරීමේ රථය - පිරිවැයට | 2 000 | |
| ලී බඩු - පිරිවැයට | 500 | |
| 12% බැංකුණය | | 500 |
| විකුණුම් | | 3 230 |
| ගැනුම් | 1 710 | |
| ණයහිමියෝ/ වෙළඳ ගෙවිය යුතු දෑ | | 400 |
| ණය ගැතියෝ/ වෙළඳ ලැබිය යුතු දෑ | 310 | |
| දුන් වට්ටම්/ ලද වට්ටම් | 40 | 50 |
| ආපසු එවුම්/ ආපසු යැවුම් | 100 | 150 |
| ගොඩනැගිලි කුලී | 100 | |
| සේවක වැටුප් (ශුද්ධ) | 270 | |
| රක්ෂණ ගාස්තු | 10 | |
| විදුලි ගාස්තු | 75 | |
| ප්‍රචාරණ වියදම් | 90 | |
| පරිපාලන වියදම් | 200 | |
| 10% ස්ථාවර තැන්පතු | 1300 | |
| ලද පොළී (ස්ථාවර තැන්පතු) | | 20 |
| ගෙවූ බැංකු ණය පොළී | 50 | |
| මුදල් හා බැංකු ශේෂය | 3595 | |
| | 10350 | 10350 |

අතිරේක තොරතුරු :-

1. 2019. 03. 31 දිනට තොගය රු. 500 000 කි.
2. සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවක දායකය දළ වැටුපින් 10% ක් වන අතර සේව්‍ය දායකය 15% කි. සේවක භාරකාර අරමුදලට (ETF) සේව්‍ය දායකය 3% කි. EPF සේවක දායකය අඩු කර වැටුප් ගෙවා ඇති අතර මේ සම්බන්ධ වෙනත් කිසිදු ගැලපීමක් සිදු කර නැත.
3. විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවා ඇති රු. 50 000 ක තොග ණයට විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇත. මෙම තොගයේ පිරිවැය රු. 40 000 කි.
4. බොල් ණය රු. 10 000 ක් කපා හළ යුතු අතර ඉතිරි ණයගැති ශේෂ මත 10% ක අඩමාන ණය වෙන් කරන්න.
5. රු. 10 000 ක පිරිවැය වූ භාණ්ඩ තොගයක් ගින්නකින් හානි වූ අතර ඉන් 80% ක රක්ෂණ වන්දි මුදලක් ලැබීමට නියමිතය.
6. ඉදිරියේ දී විකිණීමට නියමිත විකුණුම් සඳහා රු. 30 000 ක විකුණුම් අත්තිකාරකමක් විකුණුම් ලෙස සලකා සටහන් කර ඇත.

7. අයිතිකරු විසින් රු. 2 000 ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් ඇත.
8. 2019. 03. 31 දිනට උපචිත විදුලිය රු. 5 000 කි. කලින් කල ප්‍රචාරණ වියදම් රු. 10 000 කි.
9. බෙදාහැරීමේ රථය හා ලී බඩු පිළිවෙලින් පිරිවැය මත 5% ක් හා 10% ක් වාර්ෂිකව ක්ෂය කල යුතුය.
10. බැංකු ණය 2018. 04. 01 ලබා ගෙන ඇත.

අවශ්‍ය වන්නේ,

1. දිමුතුගේ ව්‍යාපාරයේ 2019. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය.
2. 2019. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු 20)

02. අ. සුපුන් පෙරේරාගේ ව්‍යාපාරයේ 2019. 03. 31 දිනෙන් අවසන් මාස තුන සඳහා ව්‍යාපාරයට අදාල තොරතුරු පහත දැක්වේ.

1/1 මාස 3 ක කාලයක් සඳහා බිල්පත් මුද්‍රණයට ගෙවීම රු. 5 000
1/2 සුපුන් පුද්ගලිකව භාවිතා කල 2019. 01. 02 දිනට රු. 1 20 000 ක් වටිනා වාහනය ව්‍යාපාරයට යෙදවීම.
2/7 මසකට රු. 25, 000 බැගින් රියදුරු වැටුප් ගෙවීම රු. 75 000
2/10 සුපුන් රු. 10 000 ක් මුදලක් සංචාරයක් සඳහා යොදා ගන්න ලදී.
3/7 වෙනත් ආදායම් ලැබීම් රු. 50 000
3/28 වාහන අලුත් වැඩියා වියදම රු. 15 000 කි. (ඉන් රු. 5 000 ක් මෙතෙක් ගෙවා ඇත)
3/31 මුළු කාර්තුව සඳහා ප්‍රවාහන සේවා ආදායම රු. 600 000 ක් ලැබුණි.

අවශ්‍ය වනුයේ,

1. ඉහත ගනුදෙනුවල බලපෑම + හා - ලකුණු යොදා ගනිමින් පහත ආකෘතියට අදාලව දැක්වීම.

| දිනය | වත්කම් = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|
| | | | |

2. 2019. 03. 31 දිනෙන් අවසන් මාස තුන සඳහා ආදායම් ප්‍රකාශනය (ලකුණු 10)

ආ. කුරුළුගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 6 000 කි. 2019. 01. 01 දින ප්‍රතිපූර්ණය කල අග්‍රිමය රු. 5 600 කි. 2019 ජනවාරි මස කරන ලද වියදම් පහත පරිදි වේ.

| දිනය | වවුචර් අංකය | ගනුදෙනුව | වටිනාකම |
|---|---|---|---|
| 2019. 01. 01 | 031 | CR පොත් මිලට ගැනීම් | රු. 400 |
| 2019. 01. 05 | 101 | ලී බඩු මිලට ගැනීම් | රු. 5 500 |
| 2019. 01. 06 | 033 | බස්රථ ගාස්තු ගෙවීම් | රු. 450 |
| 2019. 01. 10 | 034 | කාබන් පෑන් මිලට ගැනීම් | රු. 580 |
| 2019. 01. 15 | 035 | දුම්රිය ප්‍රවේශ පත්‍ර සඳහා | රු. 350 |
| 2019. 01. 17 | 110 | භාණ්ඩ මිලට ගැනුම් | රු. 10 000 |
| 2019. 01. 18 | 037 | දිවා ආහාර මිලට ගැනුම් | රු. 750 |
| 2019. 01. 20 | 038 | සිසිල් බීම සඳහා | රු. 760 |
| 2019. 01. 21 | 039 | දුරකථන ගාස්තු | රු. 800 |
| 2019. 01. 25 | 040 | මුද්දර මිලට ගැනුම් | රු. 610 |
| 2019. 01. 27 | 041 | අභිමන්ට වැටුප් අත්තිකාරම් ගෙවීම් | රු. 500 |
| 2019. 01. 31 | 131 | පුතාගේ උපකාරක පංති ගාස්තු | රු. 7000 |

අවශ්‍ය වන්නේ :-

1. 2019 ජනවාරි මාසය සඳහා සුළු මුදල් ජ'නලය
2. අදාල ලෙජර ගිණුම්

(ලකුණු 10)

03. සෝමලතාගේ ව්‍යාපාරයේ 2019 මාර්තු මාසයේ පොත්වලින් උපුටා ගැනිම් මෙසේය.

මුදල් ලැබීම්

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම් | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 3/1 | විකුණුම් | 250 250 | - | 80 000 |
| 3/1 | සිරිගෙන් ලැබීම් | 375 730 | 800 | 9 200 |
| 3/28 | කඩකුලී ලැබීම් | - | - | 10 000 |
| | | | 800 | 99 200 |

මුදල් ගෙවීම්

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | ලද වට්ටම් | වටිනාකම |
|---|---|---|---|---|
| 3/8 | X ට ගෙවීම් | 301302 | 1 500 | 18 500 |
| 3/12 | වැටුප් ගෙවීම් | 301303 | - | 10 000 |
| 3/20 | J ට ගෙවීම් | 301305 | 2000 | 48 000 |
| 3/28 | ගැනුම් | 301306 | - | 40 000 |
| | | | 3 500 | 116 500 |

ii. 2019. 03. 31 අවසන් මාසය ලද බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 3/1 | ශේෂය | - | - | 25 000 |
| 3/2 | තැන්පතු 250 | - | 80 000 | 105 000 |
| 3/12 | චෙක් 301303 | 10 000 | | 95 000 |
| 3/28 | තැන්පතු මුදල | | 10 000 | 105 000 |
| 3/29 | චෙක් 301306 | 40 000 | | 65 000 |
| 3/30 | බැංකු ගාස්තු | 1 000 | | 64 000 |
| 3/30 | තැන්පතු - කුමාරි 37973 | | 22 000 | 86 000 |
| 3/31 | රක්ෂණ වාරික | 6 000 | | 80 000 |

iii. 2019. 03. 31 වන විට අතිරේක තොරතුරු මෙසේය.

| | |
|---|---|
| ණයගැති ශේෂය (2019. 03. 01) | රු. 64 200 |
| ණයට විකුණුම් | රු. 90 000 |
| ආපසු එවුම් | රු. 3 000 |
| ණය හිමි ශේෂය (2019. 03. 01) | රු. 148 000 |
| ණයට ගැනුම් | රු. 100 000 |
| ආපසු යැවුම් | රු. 10 000 |

(සියලුම ගනුදෙනු බැංකු ගිණුම මඟින් සිදුවන බව සලකන්න.)

අවශ්‍ය වන්නේ :-

1. 2019. 03. 31 දිනට මුදල් පාලන ගිණුම
2. 2019 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය
3. 2019 මාර්තු මාසය සඳහා ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම

(ලකුණු 20)

04. පහත දැක්වෙන්නේ නිරංජන්ගේ ව්‍යාපාරයේ 2019 ජනවාරි මස සිදුවූ ණයට විකුණුම් පිළිබඳ තොරතුරු වේ.

(රු. 000)

| නම | ණයට විකුණුම් | ආපසු එවුම් රු. | මුදල් ලැබීම් රු. | දුන් වට්ටම් | බොල් ණය |
|---|---|---|---|---|---|
| රාධා | 2 000 | 200 | 1 300 | 180 | 120 |
| ක්‍රිෂ්ණා | 2 500 | 100 | 1 100 | 300 | 100 |
| රාමා | 2 200 | 200 | 1 500 | 220 | 80 |
| | 7 700 | 500 | 3 900 | 700 | 300 |

අවශ්‍ය වන්නේ :-

1. මූලික සටහන් පොත්
2. අදාල ලෙජර ගිණුම්
3. ණයගැති උපලෙජරය
4. ණයගැති ශේෂ ලැයිස්තුව පිළියෙල කරන්න.

(ලකුණු 20)

05. අ. සමගි ව්‍යාපාරයේ 2019. 12. 31 දිනට පිලියෙල කල ශේෂ පිරික්සුම සම නොවූ අතර වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කරන ලදී. පසුව පහත වැරදි සොයා ගන්නා ලදී.

1. දුන් වට්ටම් රු. 2 500 වැරදීමකින් ලද වට්ටම් ගිණුමට බැරකර ඇත.
2. රු. 3 000 බැරපතක් ගිණුම් පොත්වලින් මගහැරී ඇත.
3. රු. 4 000 ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට ගෙනගොස් නැත.
4. රු. 1 000 බොල්ණය ගිණුමේ ශේෂය ශේෂය පිරික්සුමේ නිවැරදි පැත්තේ රු. 100 ලෙස සටහන් වීම.
5. රු. 6 000 ගොඩනැගිලි අළුත්වැඩියා වියදම ගොඩනැගිලි ගිණුමට හරකර ඇත.

අවශ්‍ය වන්නේ :-

1. වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්
2. අවිනිශ්චිත ගිණුම පිළියෙල කර අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය ගණනය කරන්න.

(ලකුණු 10)

ආ. චතුරිගේ ව්‍යාපාරයේ 2019 මාර්තු මාසය සඳහා ලැබුණු බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 2019. 03. 01 | ශේෂය | - | - | 560 |
| 2019. 03. 03 | චෙක් අංකය 012 | - | 200 | 760 |
| 2019. 03. 05 | චෙක් අංකය 312 | - | 150 | 910 |
| 2019. 03. 12 | චෙක් අංකය 601 | 240 | | 670 |
| 2019. 03. 15 | චෙක් අංකට 602 | 330 | | 340 |
| 2019. 03. 31 | බැංකු ගාස්තු | 30 | | 310 |
| 2019. 03. 31 | ලද ලාභාංශ | | 70 | 380 |

වෙනත් තොරතුරු :-

- ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් 603 රු. 300
- උපලබ්ධි නොවූ චෙක් 813 රු. 250

අවශ්‍ය වන්නේ :-

1. බැංකු සැසඳුම් ප්‍රකාශය
2. සංශෝධිත මුදල් පාලන ගිණුම හා සංශෝධනය කිරීමට පෙර බැංකු ශේෂය

(ලකුණු 10)